ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 4 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2022/2023
**LLU4805/LWU2311** – ගිවිසුම් නීතිය
කාලය - පැය 1

---

දිනය : 2023 සැප්තැම්බර් 27 වේලාව: පෙ.ව 9.30 - පෙ.ව 10.30

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

---

01 (අ) අනුරාධා සතුව පැරණි වායු සමන යන්ත්‍රයක් තිබෙන අතර, ඇයට එය විකිණීම සඳහා අවශ්‍යව ඇත. අනුරාධාගේ හොඳ යෙහෙළියක වන උවිනි විසින් පාවිච්චි කරන ලද වායු සමන යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා සොයමින් සිටි නිසා අනුරාධා විසින් රුපියල් අනූදහසකට (රු.90,000/-) ඇය සතු වායු සමන යන්ත්‍රය විකිණීම සඳහා විද්‍යුත් තැපැල මාර්ගයෙන් උවිනි වෙත අර්පණයක් සිදු කරන ලදී. උවිනි විසින් රුපියල් අසූදහසක මුදලකට (රු.80,000/-) වායු සමන යන්ත්‍රය මිලදී ගැනීමට කැමැත්ත පළ කරමින් පිළිතුරු පණිවුඩයක් යවන ලදී. එයට පිළිතුරු දෙමින් අනුරාධා ප්‍රකාශ කර සිටියේ, වායු සමන යන්ත්‍රය රුපියල් අසූදහසකට විකිණීමට ඇය අකමැති බවයි. පසුව මෙම වායු සමන යන්ත්‍රය රුපියල් අනූදහසක් (රු.90,000/-) පමණ වටිනාකමින් යුක්ත බවට අවබෝධ කර ගත් උවිනි රුපියල් අනූදහසකට (රු.90,000/-) එය මිලට ගැනීමට එකඟ වන බවට විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් අනුරාධා වෙත දන්වන ලදී. කෙසේ නමුත් අනුරාධා ඒ වන විටත් වායු සමන යන්ත්‍රය දසුනි වෙත විකුණා අවසන් වී තිබුණි.

ඉහත සිද්ධියට අදාළ නෛතික ප්‍රතිවිපාකයන් පිළිබඳව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර උචිත නඩු තීන්දු අධිකාරීන් උපුටා දක්වමින් තහවුරු කරන්න.

**(ලකුණු 10)**

(ආ). තැපැල මගින් ප්‍රතිග්‍රහණය කිරීම සහ ක්ෂණික පණිවුඩ හුවමාරු ඔස්සේ සිදු කරනු ලබන ප්‍රතිග්‍රහණය අතර වෙනස පැහැදිලි කරන්න. අදාළ නඩු තීන්දු අධිකාරීන් මගින් ඔබේ පිළිතුර තහවුරු කළ යුතුය.

**(ලකුණු 10)**
**(10+ 10 = ලකුණු 20)**

02 (අ) අමල් ,මේනක සහ සාමා යන අයට පියාගෙන් උරුම නිවසක් විය. පසුව අමල් සහ ඔහුගේ බිරිද වන ෂනායා එම නිවසේ ජීවත් වූ අතර ෂනායා විසින් එම නිවස වෙත බොහෝ වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. එකී වැඩිදියුණු කිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන් එකී නිවසේ වටිනාකම හරයාත්මකව ඉහළ යන ලදී. එම නිසා අමල් ,මේනක සහ සාමා වැඩිදියුණු කිරීම් වෙනුවෙන් ෂනායා වෙත මුදල් ගෙවීමට තීරණය කළහ. ඒ අනුව ඔවුන්ගේ අත්සනින් යුතුව ෂනායා ආමන්ත්‍රණය කරමින් ලේඛණයක් සකස් කරන ලද අතර එකී ලේඛණයෙහි පහත පරිදි සඳහන් කර තිබුණි."ඔබ විසින් දේපළට කරන ලද වැඩිදියුණු කිරීම් සහ වෙනස් කිරීම් සැලකිල්ලට ගෙන නිවස විකුණන අවස්ථාවේදී ඔබ වෙත රුපියල් ලක්ෂයක (රු.100,000/-) මුදලක් ගෙවීමට අප මෙයින් එකග වෙමු." වශයෙනි.කෙසේ වෙතත් නිවස විකුණන අවස්ථාවේදී අමල් ,මේනක සහ සාමා විසින් ෂනායා වෙත අදාළ මුදල ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදහ.

ගිවිසුම් නීතියේ ප්‍රතිෂ්ඨාව (Consideration) සම්බන්ධ ඔබේ දැනුම භාවිතයෙන්, අමල් ,මේනක සහ සාමා විසින් ෂනායා වෙත මුදල් ගෙවීමට වූ පොරොන්දුව නෛතිකව බලාත්මක කර ගැනීමට ෂනායාට හැකියාව පවතීද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර උචිත නඩු තීන්දු අධිකාරීන් උපුටා දක්වමින් තහවුරු කරන්න.

**(ලකුණු 10)**

(ආ). ***Central London Trust Ltd V. High Trees House Ltd (1947) 1 KB 130*** නඩු තීරණය Doctrine of Promissory Estoppel සිද්ධාන්තය වර්ධනය මගින් පිනල්ස් රීතියෙහි ( Pinnel's Rule) දෘඪ තාවය අවම කිරීම සඳහා කටයුතු කරන ලදී.

ඔබ ඉහත ප්‍රකාශය සමග එකග වන්නේද? ඔබේ පිළිතුර නඩු තීන්දු අධිකාරීන් භාවිතයෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**
**(10+ 10 = ලකුණු 20)**

-----හිමිකම් ඇවිරිණි-----